السنّة النبوية وعلومها
www.sunnah.global

“සැබැවින්ම ආදම්ගේ දරුවන්ගේ සියලු හදවත් මහාකරුණිකයාණන්ගේ ඇඟිලිවලින් ඇඟිලි දෙකක් අතර එක් හදවතක් මෙන් පවතී. ඔහු අභිමත කරන පරිදි එය ක්රියා කරවයි.”

සැබැවින්ම තමන් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයකට සවන් දුන් බව පවසමින් අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්න් අල් ආස් (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ වාර්තා කරන ලදී: “සැබැවින්ම ආදම්ගේ දරුවන්ගේ සියලු හදවත් මහාකරුණිකයාණන්ගේ ඇඟිලිවලින් ඇඟිලි දෙකක් අතර එක් හදවතක් මෙන් පවතී. ඔහු අභිමත කරන පරිදි එය ක්රියා කරවයි.” පසුව අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ ප්රාර්ථනා කළහ. اللهم مُصَرِّفَ القلوبِ صَرِّفْ قلوبَنا على طاعتك (අහෝ හදවත් ක්රියා කරවන්නාණනි! අපගේ හදවත් ඔබට අවනත වන අයුරින් ක්රියා කරවනු මැනව!)."

[صحيح] [رواه مسلم]

"සැබැවින්ම ආදම්ගේ දරුවන්ගේ සියලු හදවත් මහාකරුණිකයාණන්ගේ ඇඟිලි අතර ඇඟිලි දෙකක් මධ්යයේ එක් හදවතක් මෙන් පවතී. ඔහු අභිමත කරන පරිදි එය ක්රියා කරවයි". යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඔහු අභිමත කළේ නම් එය සත්යය මත පිහිටුවාලයි. ඔහු අභිමත කළේ නම් සත්යයෙන් ලිස්සා යන්නට ඉඩ හරියි. සියලුම හදවත් ක්රියා කරවනුයේ එක් හදවතක් ක්රියා කරවන පරිදිය. අල්ලාහ්ගේ එක් කටයුත්තක් තවත් කටයුත්තක කාර්යබහුල නොකරයි. පසුව අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ ප්රාර්ථනා කළහ. "අල්ලාහුම්ම මුසර්රිෆුල් කුලූබ් " (අහෝ දෙවිඳුනි, විටෙක අවනතභාවය වෙත හා තවත් විටෙක පිටුපෑම වෙත ද තවත් විටෙක දෙවියන් සිහිපත් කිරීම වෙත හා ඒ ගැන නොසැලකිලිමත් කම වෙතද - හදවත් ක්රියාකරවන්නාණනි!) සර්රිෆ් කුලූබනා අලා තාඅතික (අපගේ හදවත් ඔබට අවනත වන අයුරින් ක්රියා කරවනු මැනව!)

https://sunnah.global/hadeeth/si/show/6331

النجاة الخيرية
ALNAJAT CHARITY
لجنة الدعوة الإلكترونية
EDC E-Da'wah Committee